සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමු වාර පරීක්ෂණය - 2020


## 11 - ශ්‍රේණිය

## චිත්‍ර කලාව

නම/විභාග අංකය :- ..........................................................  කාලය: පැය 01යි.

## <u>I කොටස</u>

- සියලු ම ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- පහත සඳහන් ඡායාරූප ඇසුරු කරගෙන අංක 01 -05 තෙක් ප්‍රශ්නවල හිස්තැන් පුරවන්න.



(01) ක්‍රි.ව. 5 වන සියවසේ ........................................................ රජු විසින් මෙය නිර්මාණය කරන ලදී.

(02) මෙම ස්ථානය ...................................................... නමින් හඳුන්වනු ලබයි.

(03) මෙම පර්වතයේ බටහිර බෑවුමේ චිත්‍ර ඇඳ ඇති අතර එහි තේමාව වූයේ ...................................................... ය.

(04) මෙහි ඇති සිතුවම් ඉන්දියාවේ ...................................................................... චිත්‍රවලට සමානකමක් දක්වයි.

(05) මෙම චිත්‍ර ඇඳ ඇත්තේ ............................................................................................................ ශිල්ප ක්‍රමයට ය.

- **අංක 06 සිට 10 තෙක් දී ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

(06) එම්. සාර්ලිස්ගේ ලිතෝ මුද්‍රිත සිතුවමක් වන "සිදුහත් කුමරු සහ මව් බිසව" චිත්‍රය කිනම් ශෛලියක ආභාසයක් දැකගත හැකි ද? ........................................................................................................................

(07) සට්ටනාදර් ශිව දේවාලයේ දැකිය හැකි සුදු කුකුළා නම් සිතුවම කාගේ නිර්මාණයක් ද?

..........................................................................................................

(08) රෆායල් විසින් අඳින ලද "තණ පිටියේ සිටින මැඩෝනා" චිත්‍රය සිතුවම් කිරීමට යොදාගත් මාධ්‍යයන් මොනවා ද?

..........................................................................................................

(09) මහනුවර ත්‍රිත්ව දෙව් මැදුරේ සිතුවම් ඇඳ ඇති ශිල්පියා කවු ද? ........................................................................

(10) හින්දු වාස්තු විද්‍යාත්මක ආභාසය අනුව නිර්මාණය කළ තිවංක පිළිමගේ සිතුවම් කර ඇති "බුදුන් සංකස්සපුරයට වැඩීම" සිතුවම හමුවන්නේ කුමන ස්ථානයකින් ද? ..........................................................................................

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා දී ඇති ප්‍රශ්න සඳහා වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(11) මීඩම්හි පාත්තයෝ
(1) ඊජිප්තුවේ පැරණි රාජධානි සමයට අයත් නිර්මාණයකි.
(2) මෙය ඇලබැස්ටර් පාෂාණයෙන් කරවා ඇත.
(3) මෙහි ඇති පාත්තයින් සියලු ම දෙනා එක ම දිසාවකට ගමන් කරන විලාසයෙන් දකවා ඇත.
(4) මෙය අල්ප උන්නත ශිල්ප ක්‍රමයට නිමවා ඇත.

(12) සෙංකෝලය
(1) සෙංකෝලය කළුවර ලීයෙන් නිමවා ඇත.
(2) සෙංකෝලය පාර්ලිමේන්තුව තුළ කතා නායකවරයාගේ අධිකාරි බලය සංකේතවත් කරයි.
(3) සෙංකෝලය කැටයම්වලින් තොර ඉතා චාම් නිර්මාණයකි.
(4) සෙංකෝලය ඉන්දියානු පාර්ලිමේන්තුව මඟින් 1949 මෙරට පාර්ලිමේන්තුවට හඳුන්වා දෙන ලද්දකි.

(13) නිවැරදි පැහැය ඇති ද්විතීයික වර්ණයක් වීමට නම්
(1) කළු හා සුදු එකතු කිරීමෙන් සැදෙන වර්ණයකි.
(2) මූලික වර්ණ දෙකක් මිශ්‍ර කිරීමෙන් සැදෙන වර්ණයකි.
(3) මූලික වර්ණයක් හා තෘතීය වර්ණයක් මිශ්‍ර කිරීමෙන් සැදෙන වර්ණයකි.
(4) මූලික වර්ණ දෙකක් සමානුපාතික ව ගෙන මිශ්‍ර කිරීමෙන් සැදෙන වර්ණයකි.

(14) පංචානාරි ඝටය
(1) කාන්තා රූප පහක් සම්පිණ්ඩනය කර කලයක හැඩය ගත් නිර්මාණයකි.
(2) කාන්තා රූප පහක් සම්පිණ්ඩනය කර නිර්මාණය කර ගන්නා පංචනාරි පල්ලැක්කියයි.
(3) පංචනාරි ඝටය සශ්‍රීකත්වයේ සංකේතයක් වශයෙන් ව්‍යවහාර වන්නට ඇතැයි සෙනරත් පරණවිතාන මහතාගේ මතයයි.
(4) පංචනාරි ඝටය කාන්තා රූප සහ පුරුෂ රූප සංකලනය කර නිර්මාණය කරන ලද සැරසිල්ලකි.

(15) බන්ධුල හරිශ්චන්ද්‍ර
(1) සාරංගා, සුසීමා, කළු පරෙවියෝ වැනි නිර්මාණ බිහිකළ චිත්‍රකතා ශිල්පියෙකි.
(2) මොහුගේ මුල් ම චිත්‍ර කතාව වූයේ සිළුමිණ පත්‍රයේ පළ වූ "ඉන්දු" නම් චිත්‍ර කතාවයි.
(3) ශ්‍රී ලංකාවේ ප්‍රථම වර්ණ චිත්‍රකතාව ලෙස "නල දමයන්ති" නිර්මාණය කරන ලද්දේ මොහු විසිනි.
(4) ශ්‍රී ලංකාවේ ප්‍රථම චිත්‍ර කතාව ලෙස ලංකාදීප පුවත්පතේ පළ වූ "නීලා" මොහුගේ නිර්මාණයකි.

- **ප්‍රශ්න අංක 16 සිට 20 තෙක් දී ඇති වැකි වල අර්ථය පැහැදිලි වනසේ සම්පූර්ණ වාක්‍ය බැගින් ලියන්න.**

(16) කියොරොස්කුරෝ ..................................................................................................................

..................................................................................................................

(17) නියපොතු වැඩ ..................................................................................................................

..................................................................................................................

(18) අල්ප උන්නත ..................................................................................................................

..................................................................................................................

(19) කටක හස්ත ..................................................................................................................


..................................................................................................................

(20) තිවංක/ ත්‍රිභංග ..................................................................................................................

..................................................................................................................

- **ප්‍රශ්න අංක 21 සිට 25 තෙක් දී ඇති රූප සටහන්වලට කිසියම් සබඳතාවක් දක්වන රූප සටහන ඉදිරියෙහි ඇති A, B, C, D, E යන යන රූප සටහන් අතුරෙන් තෝරා එහි අක්ෂරය තිත් ඉර මත ලියන්න.**

(21)  (..............)

A 

(22)  (..............)

B 

(23)  (..............)

C 

(24)  (..............)

D 

(25)  (..............)

E 

- **ප්‍රශ්න අංක 26 සිට 30 තෙක් දී ඇති එක් එක් වාක්‍යයන්හි හිස්තැනට සුදුසු වචනය යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.**

(26) ජී. එස්. ප්‍රනාන්දු ශිල්පියා විසින් දිය සායම් මාධ්‍යයෙන් සිතුවම් කරන ලද .................................................. සහ උළු පෝරණුව නම් සිතුවම් කොළඹ ජාතික කලා භවනේ නිත්‍ය ප්‍රදර්ශනයට තබා ඇත.

(27) ගජමෑන් නමින් ප්‍රසිද්ධ කාටුන් චරිතය ඇඳ ඇත්තේ .................................................. නම් වූ ශිල්පියා ය.

(28) අඳුරු සහ ආලෝකමත් වර්ණ යොදාගනිමින් ස්ටැන්ලි අබේසිංහ මහතා විසින් අඳින ලද .......................................... නම් සිතුවම තුළින් රාත්‍රී කාලය ඉතා සාර්ථකව නිරූපණය කර ඇත.

(29) ලංකාවේ විශාල චෛත්‍යවල අලංකාරය හා ආරක්ෂාව සඳහා සතර දිශාවට නිර්මාණය කර ඇති ගෘහ නිර්මාණ අංගය .................................................. ලෙස හඳුන්වයි.

(30) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයෙන් හමු වූ එක් කවන්ධ රූපයක් නෙළීම සඳහා රතු වැලිගල් මාධ්‍ය ද අනෙක් කවන්ධ රූපය නෙළීම සඳහා .................................................. මාධ්‍ය ද යොදාගෙන ඇත.

- අංක 26 සිට 30 තෙක් දී ඇති ප්‍රශ්නවලට **G, H, I, J, K** යන රූප සටහන් ඇසුරෙන් පිළිතුරු සපයන්න.


G


H


I


J


K

(31) G අක්ෂරයෙන් දැක්වෙන සිතුවම නිර්මාණය කළ ශිල්පියා කවු ද? ..............................................................................

(32) H අක්ෂරයෙන් දක්වෙන මූර්තිය අයත් වන්නේ කුමන යුගයකට ද? ..............................................................................

(33) I අක්ෂරයෙන් දක්වෙන මූර්තිය නිර්මාණය කර ඇති මාධ්‍ය කුමක් ද? ..........................................................................

(34) J අක්ෂරයෙන් දක්වෙන ලියනාඩෝ ඩාවින්චි ශිල්පියාගේ නිර්මාණයක් වන සිතුවම හැඳින්වෙනුයේ කිනම් නමකින් ද? ..............................................................................

(35) K අක්ෂරයෙන් දැක්වෙන සිතුවම සඳහා ආභාසය වී ඇති කලා ශෛලිය කුමක් ද? ....................................................

- **මෙහි දැක්වෙන වර්ණ චිත්‍රය හඳුනාගෙන එහි කලාත්මක අගය විග්‍රහ කෙරෙන පරිදි අංක 36 සිට 40 තෙක් දී ඇති උපමාතෘකාවලට අදාළව අර්ථවත් වාක්‍ය පහක් ලියන්න. (තනි වචනයෙන් පිළිතුරු සැපයීම ලකුණු නොලැබීමට හේතුවක් වනු ඇත.**



(36) ශිල්පියා පිළිබඳව ..............................................................................

(37) නිරූපිත තේමාව පිළිබඳව ..............................................................................

(38) සංරචනය කර ඇති අයුරු ..............................................................................

(39) වර්ණ භාවිතය පිළිබඳව ..............................................................................

(40) හැඟීම් ප්‍රකාශනය පිළිබඳව ..............................................................................

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමු වාර පරීක්ෂණය - 2020

**11 - ශ්‍රේණිය**

**චිත්‍ර කලාව II**

ලකුණු 30
කාලය: පැය 2යි.

නිදහස් රේඛාමය ඇඳීම හා වර්ණ චිත්‍ර සම්පිණ්ඩනය

- ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය හොඳින් නිරීක්ෂණය කරන්න.
  1. රේඛා මගින් පූර්ව අධ්‍යයනයක යෙදෙන්න.
  2. ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන අයුරින් ඇඳ වර්ණ කරන්න.
- ඔබේ චිත්‍රය ඇගයීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි සැලකිලිමත් වන බව සලකන්න.

- නිදහස් රේඛා අධ්‍යයනය
  1. මුල් කඩදාසියේ කරනු ලබන පූර්ව අධ්‍යයනයේ දී දක්වන කුසලතා
- වර්ණ චිත්‍රය
  2. ද්‍රව්‍ය සමූහය, තලය මත කලාත්මකව සම්පිණ්ඩනය වීම
  3. පරිමාණ, පර්යාලෝක රීති හා ත්‍රිමාණ ලක්ෂණ පිළිබඳ අවබෝධය
  4. දෙන ලද ද්‍රව්‍ය සමූහයේ මතුපිට ස්වභාවය හා ගති ලක්ෂණ දැක්වීම
  5. වර්ණ හැසිරවීමේ ශිල්පීය කුසලතාවය
  6. උචිත වර්ණවත් පසුබිමක් යෙදීම හා සමස්ත නිමාව

සැ.යු.:

ද්‍රව්‍ය සමූහය තබා ඇති ලෑල්ල විශාල ලෙස ඇඳීම අවශ්‍ය නොවේ. ලෑල්ලේ පරිමාණය ද්‍රව්‍ය සමූහයට ගැලපෙන අයුරින් වෙනස් කර ඇඳීමට ඔබට අවසර ඇත.

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමු වාර පරීක්ෂණය - 2020

## 11 - ශ්‍රේණිය

## චිත්‍ර කලාව III

ලකුණු 30
කාලය: පැය 2යි.

- දිය සායම්, පෝස්ටර් සායම්, පැස්ටල් ඇතුළු අතේ නොගෑවෙන ඕනෑම වර්ණ මාධ්‍යයක් වර්ණ කිරීම සඳහා භාවිත කළ හැකි ය.

- 'අ' කොටසින් හෝ 'ආ' කොටසින් හෝ 'ඉ' කොටසින් හෝ **එක් මාතෘකාවක් පමණක් තෝරාගන්න.**

<u>'අ' කොටස - චිත්‍ර සංරචනය</u>

01. ගමේ පන්සලේ බෝ මළුවේ සිසිලස විඳිමින් භාවනාවේ යෙදෙන සිල්වත් උපාසක උපාසිකාවන්
02. නිවාසාන්තර තරගෙදි අපේ නිවාසය ජය අරන්
03. අලි බලන්න ගිය ගමේ නඩේ
04. ගමේ තාප්පය හැඩකරන තරුණ පිරිසක්

<u>'ආ' කොටස - මෝස්තර නිර්මාණය</u>

05. විසිතුරු මල් බඳුනක් නිර්මාණය කර සාම්ප්‍රදායික සැරසිලිවලින් අලංකාර කරන්න.
06. නිර්මාණාත්මක හැඩවලින් යුක්ත මල් සහ කොළ යොදා චීත්ත රෙද්දකට ව්‍යාප්ත මෝස්තරයක් නිර්මාණය කරන්න. (අඟල් 9 × 9 ප්‍රමාණයෙන්)
07. පරිසරය යන තේමාව යටතේ නිර්මාණාත්මක හැඩතල භාවිත කරමින් බිතු කැටයමක් සඳහා උචිත සැලසුම් චිත්‍රයක් නිර්මාණය කරන්න.

<u>'ඇ' කොටස - ග්‍රැෆික් චිත්‍ර</u>

08. "එකමුතුකමින් රට හදමු" මාතෘකාව ප්‍රකාශිත වර්ණවත් පෝස්ටරයක් නිර්මාණය කරන්න.
09. ඔබ පාසලේ නිවාසාන්තර ක්‍රීඩා උළෙලට ඇරයුම් කෙරෙන, ආරාධනා පතක් නිර්මාණය කරන්න.
10. "මහනුවර යුගයේ බිතු සිතුවම්" යන මාතෘකාවට උචිත පිටකවරයක් නිර්මාණයක් කරන්න.

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමු වාර පරීක්ෂණය - 2020

### 11 - ශ්‍රේණිය

### චිත්‍ර කලාව පිළිතුරු

**I පත්‍රය**

(01) කාශ්‍යප

(02) සීගිරිය / සිංහපාද මළුව

(03) කාන්තා උඩුකය රූප/ ස්ත්‍රී රූප/ සීගිරි කාන්තාවන්/ සීගිරි අප්සරා රූප

(04) අජන්තා

(05) ප්‍රෙස්කෝ / ප්‍රෙස්කෝ බුවනෝ / වියළි හුණු බදාමය

(06) අපරදිග / බටහිර ස්වභාවිකවාදී චිත්‍ර ශෛලියේ ආභාසය

(07) කාවඩි මු. තුරෙයිසාමි ශිල්පියා

(08) ලී පුවරුවක් මත තෙල් සායම් මාධ්‍යයෙන්

(09) ඩේවිඩ් පෙන්ටර්

(10) ගර්භ ගෘහයේ

(11) 1

(12) 2

(13) 4

(14) 1

(15) 3

(16) ආලෝකය හා අඳුර මනා ලෙස දක්වන ආකාරය, ආලෝකය හා අඳුර පිළිබඳ ශාස්ත්‍රාලයීය ඥාණය, අඳුර තුළින් ආලෝකය වඩාත් තීව්‍ර ලෙස මතු කිරීම

(17) ලාක්ෂා කර්මාන්තයේ දී නියපොත්ත භාවිතා කර කරන සියුම් වැඩ
ලාක්ෂා කර්මාන්තයේ දී කරනු ලබන සියුම් වැඩ
ලාක්ෂා සැරසිලි කරන ක්‍රමයකි.

(18) යම් නිර්මාණයක් ස්වල්ප වශයෙන් මතුකර දැක්වීම
සඳකඩ පහන සඳහා මෙම ශිල්ප ක්‍රමය භාවිත කර ඇත.

(19) යමක් අල්ලාගෙන සිටින ආකාරය රූපිතය.
පත්කුලිය හා අවුකන බුද්ධ ප්‍රතිමාවල දක්නට ලැබේ.

(20) තුන් තැනකින් නැමුණු, හිස, ඉන, දෙදන යන තුන් ස්ථානයෙන් වක් වූ (නැමුණු) ආකාර සහිත ඉරියව්ව.

(21) D

(22) A

(23) E

(24) B

(25) C

(26) ගඩලාදෙණිය

(27) කැමිලස් පෙරේරා

(28) පෙරහැර / ඇසළ පෙරහැර

(29) වාහල්කඩ

(30) අළු වැලි ගල්

(31) පැබිලෝ පිකාසෝ

(32) පුබුදු යුගය / පුනරුද යුගය

(33) කිරි ගරුඩ

(34) පර්වත මස්තකයේ දේවමෑණියෝ

(35) බටහිර සනිකවාදී කලා ලක්‍ෂණ / හින්දු දර්ශනයේ තන්ත්‍රයාන ලක්‍ෂණ

(36) මුදලිඳු ඒ.සී.ජී.එස්. අමරසේකර ශිල්පියා විසින් මෙම සිතුවම අඳින ලදී.

(37) මෙම සිතුවම 'විරැකියාව' ලෙස හැඳින්වේ.

මෙම සිතුවම 'වඩුවාගේ ගෙදර' ලෙස හැඳින්වේ.

රැකියාව අහිමි වූ වඩුවකුගේ ගෙදර මෙම සිතුවමින් පෙන්වයි.

(38) දරිද්‍රතාවයෙන් පෙළෙන වඩු පවුලක් තලය පුරා සම්පිණ්ඩනය කර ඇත.

(39) ඒක වර්ණික ලක්‍ෂණ ඇති සම්භාව්‍ය වර්ණ මාලාවක් මෙම සිතුවම සඳහා භාවිත කර තිබේ.

(40) මානව රූපයේ සුන්දරත්ව මෙන් ම දරිද්‍රතාවය ආදී අභ්‍යන්තර හැඟීම් ප්‍රකාශනයක් මෙම සිතුවමින් නිරූපණය කෙරේ.

අඟහිඟකමින් පිරුණු වඩුගෙදර දුක්මුසු ස්වභාවය මෙම සිතුවමින් නිරූපණය වේ.

අපොස සා/පෙළ පසුගිය විභාග ප්‍රශ්නෝත්තර වට්ටම් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට

**www.lol.lk**
**Learn Ordinary Level**

LOL.lk online Book Store

අමතන්න - 071 777 4440/0756999990/071 8540371



# LOL.lk
online Book Store

071 777 4440/0756999990/071 8540371

## පළාත් ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්










## ආදර්ශ ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්














## කෙටි සටහන් පොත්










වට්ටම් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට

**www.lol.lk**

**Learn Ordinary Level**

අමතන්න - 071 777 4440/0756999990/071 8540371

PAST PAPERS WIKI

# ප්‍රශ්නපත්‍ර පොත්
# ගෙදරටම ගෙන්ව ගන්න
# ඔන්ලයින් ඕඩර් කරන්න
# WWW.LOL.LK
# වෙත යන්න

BUY NOW

Secure Payments By PayPal VISA MasterCard DISCOVER
NO PAYPAL ACCOUNT NEEDED!

# ONLINE BOOK STORE



An evening of fun for young readers